

# වනබිම සැරිසර



නිමල් සේදර

## ඇත් ගොව්වා මරා කෑ පණාමුරේ කණා

අලියෙකු මිනමස් කෑවායයි යමකු පැවසුවොත් එය එකවරම පිළිගැනීමට අසන්නත් මැලිවනු ඇත. එහෙත් එබන් දක සිදුවිය නොහැකි දෙයක් නොවේ. සිය ගොව්වා මරා ඔහුගේ ශරීරයේ කොටස් ගිජුලෙස ගිල දැමූ මොල මුරේ කණාගේ කතාව ඊට නිදසුනකි.

මොලමුරේ පරපුරේ අලිඇතුන් රංචුව ශ්‍රී ලංකාවේ පමණක් නොවෙයි රටරටවලත් ප්‍රසිද්ධය. අලි ඇතුන් පිළිබඳ රසකතා සොයායන කෙනෙක්ට මොල්මුරේ දිසාවගේ අලි ඇතුන් පිළිබඳ ගොතන කතාබහා අමතක කරන්නට පුළුවන් කමක් නැත.

මොලමුරේ මහතාගේ අලි ඇතුන්අතර "කණා" නමින් අලියෙක් සිටියේය. මේ අලියාට "කණා" යැයි කීවේ එක් ඇසක් අන්ධ විම නිසයා. පෙනුමෙන් ප්‍රතාපවත් ව යෝධ පෙනුමක් ඇති මේඅලියා බලා ගත් අලිකාරයාගේ නම "කමෙල" ය.

මොලමුරේ මහතාට යටත් වැසියෝ ඉමහත් ගෞරවයෙන් හරසර දැක් වූහ. මහජනයා තුළ මොලමුරේ මහතාට ඇති ගෞරවයෙන් අයතු ප්‍රයෝජන ගන්නට පටන් ගත්තේ " කණා" බලන සාමෙල්ය. සාමෙල් ඉතා නරක පුරුද්දක් ඇතිකර ගත්තේය. ඒ වණාහි කණාගෙන ගොස් අහිංසක ගැමියන්ගේ වතුපිට්වල නිදැල්ලේ මුදාහැරීමය.

අසරණ ගැමියන්ගේ වතුපිට්වල කෙසෙල් ගස් උක්ගස් එළවළු මේ සියල්ලම "කණා" නිසා විනාශ වී ගියේය.

අනේ සාමෙල් අයියා ඔය "කණා" අපේ වත්තට දාන්න නම් එපා" කාන්තාවන් මැසිවලින් නෑගූවද
ඔහුගෙ හිතේ උණුවීමක් නැත. අසරණ මිනිස්සුන්ට කරකියා ගත හැකි දෙයක් නොව තැන් මේ අපරාධය පිළිබඳ කතරගම දෙයියන්ට පඬුරු වෙන්කර දෙවියන්ට දුක කියාලූහ. සාමෙල්ට එරෙහිව දෙවියන්ට යාතිකා කළහ. සාමෙල්ට විරුද්ධව මොලමුරේ මහතාට පැමණිලි කරන්නට යන්නට කිසාදු ගැමියකුට ශක්තිය නොතිබිණි.

එක් දිනක් සුපුරුදු ගණාං කාරකමට සාමෙල් "කණා" ගෙනැවිත් ගැමියකුගේ වත්තට නිදැල්ලේ දමා ආහාර සපයා දුන්නේය. මේ අතර වත්තෙන් කිතුලක් කපා "කණා" ට ආහාර පිණිස ඇදගෙන යෑමටද කටයුතු යෙදුවේය. කිතුල කපමින් සිටියදි සාමෙල්ට රා කට්ටක් බොන්නට දෙළක් ඇතිවිය.

ගැමයක්ගෙන් විමසුවිට ගැමියා රා තිබෙන ඉසව්ව හනික දක්වාලිය. අලියා ගසක දිගේලි කරදමා කිතුල කැපීමේ කො-න්ත්‍රාත්තුව තවත් කෙනෙකුට බාරදී ඔහු රා බොන්නට වනයට වැදුනේය. රා බිව් සාමෙල් මත නිසා ටික වේලාවකට යෝධ ගසකට පිටදී ඉඳගත්තේය. මොහොතකින් ඔහුට නින්ද ගියේය.

"කණා" බැඳ දමන ලද තැන ගහේය.

සාමෙල් කිතුල ළඟ තාමත් නින්දේය. ගෙන යන්නට කපන ලද කිතුල තාමත් එතැනය. සාමෙල්ට තරු විසිවූයේ පසුදිනට පහන වී තිබියදී අවදි වෙත්මය.
ඔහු මොහොතක් කල්පනා කලේ තාම සිටින්නේ කොතැනද ? මෙය සැඳෑවක් ද නැතහොත් පසුදින උදයද යනාදිය-යි. පසුදිනට පහන් වී ඇතිබව අවබෝධ කරගත් සාමෙල්ට කණා මතක්විය.

සාමේල් හණිකට පැමිණියේ "කණා" ගැටගසා සිටිය ගස අසලටය. අලියා ගේ හඬෙන් අලියාගේ ඉරියව් හැඳිනගන්නට අලිකාරයින්ට පුළුවන්කම තිබේ. අලියා කුසගින්න නිසා කුපිතව සිටින බව සාමෙල් අවබෝධකර ගත්තේය. ළඟට නොගොස් දුරතියා අලියාට කතාකිරීමට සාමෙල් වග බලා ගත්තේය.

සිදු වූවරදට සමාව ඉල්ලන්නාක් මෙන් සාමෙල් බියෙන් බියෙන් අලියා අසලට කිට්ටුවිය. තමා ගැන බිඳක් හෝ තැකීමක් නොමැතිව කටයුතු කිරීම සම්බන්ධයෙන් කලකිරී සිටි කණා එක මොහොතකින් හොඬවැල යවා සාමෙල් පටලාවා ගත්තේය.

බේරීමක් නොමැති බව තේරුම් ගත් සාමෙල් බෙරිහන් දී මරලතෝනි නැඟි අතර හස්තියාද මහ හඬින් සාමේල් නිමේෂයකින් උස්සා පොළොවේ ගැසුවේය.

සාමෙල්ගේ මළසිරුරේ හිසත්.......... සෙසු සියලු කොටස් අලයා ගිල දැම්මේ පෙරුම් පුරාගෙන ආ වෛරයක් පිරිමැසීමට මෙනි. කණා ඉන්පසු කැලෑ වැදුණේය. වනපිටි පාළු කරමින් දින ගණනක්ම "කණා" පළාත් වාසීන් බියගැන්වීය. අවසානයේ දඩයං කන්ද තම්පතේ හරහා රිකිල්ලන පාරේ යන අතර ගැමියෝ මග රැකසිට තොණ්ඩු දමා අලියා අල්ලාගත්හ.

